# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 ජූනි මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016. 06. 20 දින නිකුත් කරන ලදී)**

### සත්ව ආහාර (සංශෝධන)

**1986 අංක 15 දරන සත්ව ආහාර පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## *නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් 1986 අංක 15 දරන සත්ව ආහාර පනතේ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබයි.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පනතේ සාමාන්‍ය පරිපාලනය සිදු කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම සහ අනෙකුත් නිලධාරීන් පත් කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***4 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබයි. නව වගන්තිය මගින් සත්ව ආහාර රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සඳහා විධිවිධාන සලසයි.

***5 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බලපත්‍රයක් ලබා නොගෙන යම් සත්ව ආහාරයක් ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම තහනම් කිරීම වේ.

***6 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 5 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 5 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***8 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අනුමත කරන ලද සත්ව ආහාරයක් හැර, වෙනත් යම් සත්ව ආහාරයක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙද හැරීම තහනම් කිරීම වේ.

***9 වන වගන්තිය :*** මෙම වගන්තියට 7අ අලුත් වගන්තිය ඇතුළත් කරයි. නව වගන්තිය මගින් යම් අනුමත කරන ලද සත්ව ආහාරයක් විකිණීමට, විකිණීම සඳහා නිරාවරණය කර තැබීමට, විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට, ගබඩා කිරීමට, සැපයීමට හෝ බෙද හැරීමට භාවිතා කරන පරිශ්‍රයන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසයි.

***10 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 3 වන සහ 4 වන වගන්ති මගින් කරන ලද සංශෝධනයන්ට ආනුෂංගික වන අතර, සත්ව ආහාර උපදේශක කමිටුවේ සංයුතිය ඉහල නැංවීම ද සිදු කරනු ලබයි.

***11 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කමිටුවේ කර්තව්‍ය පුළුල් කිරීම වේ.

***12 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 6 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සත්ව ආහාර පිළිබඳව අඛන්ඩව අධ්‍යයනය කිරීම සඳහා සහ වාර්තා කිරීම සඳහා කමිටුවට හැකියාව ලබා දීම වේ.

***14 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 13 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***15 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, අනුමත කරන ලද සත්ව ආහාර සඳහා ලබා දී ඇති ආරක්ෂාව ව්‍යාප්ත කිරීම වේ.

***16 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම තීරණයට එකග නොවන පුද්ගලයකුට යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකරණයක දී අභියාචනා කිරීමට හැකියාව ලබා දීම වේ.

***17 වන 18 වන සහ 19 වන වගන්ති :*** මෙම වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන 21 වන සහ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 5 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***20 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් රාජ්‍ය නිලධරයකු බලයලත් නිලධරයකු වශයෙන් නම් කිරීමට හැකියාව ලබා දීම සහ යම් සත්ව ආහාරයක් විකිණීම සඳහා හෝ වෙනත් කාර්යක් සඳහා ලග තබාගෙන ඇති යම් පුද්ගලයකුගෙන් එම සත්ව ආහාරයේ සාම්පල් විශ්ලේෂණය කිරීම සඳහා ලබා ගැනීමට විධිවිධාන සැලසීම වේ.

***21 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 25 වන වගන්තියේ කාර්ය සඳහා තීරක විශ්ලේෂකට අමතරව බලයලත් විශ්ලේෂක ද ඇතුළත් කිරීම වේ.

***22 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, දඩ මුදල ඉහළ දැමීම වේ.

***23 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ස්වයං මිශ්‍රිත සත්ව ආහාර නිෂ්පාදන සඳහා වූ ප්‍රමිති නියම කිරීමට අමාත්‍යවරයාට නියෝග සෑදීම සඳහා හැකියාව ලබා දීම වේ.

***24 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, "සතා" "ආනයන සහ අපනයන පාලකවරයා,""අධ්‍යක්ෂ ජනරාල්වරයා,""බෙදාහරින්නා," "ස්වයං මිශ්‍රිත සත්ව ආහාර," "විකුණන්නා" සහ"භාවිත කරන්නා" යන යෙදුම් සඳහා අර්ථ නිරූපනය ඇතුළත් කිරීම වේ.

***25 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්ති නීතියේ බලපෑම වනුයේ, "සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා" සහ "අධ්‍යක්ෂවරයා" යන වචන යෙදී ඇති සෑම ස්ථානයක් සඳහා ම "සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීම වේ.

# සත්ව ආහාර (සංශෝධන)

එල්.ඩී.—ඕ. 69/2006

**1986 අංක 15 දරන සත්ව ආහාර පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක  දරන සත්ව ආහාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1986 අංක 15 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1986 අංක 15 දරන සත්ව ආහාර පනතේ දීර්ඝ නාමයේ "සත්ව ආහාර නිෂ්පාදනය කිරීම, විකිණීම සහ බෙදා හැරීම" යන වචන වෙනුවට "සත්ව ආහාර නිෂ්පාදනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ආනයනය කිරීම, බෙදා හැරීම සහ භාවිතා කිරීම" යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා.

2. (1) (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ පනතේ සාමාන්‍ය පරිපාලනය සඳහා වගකිව යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒවාට බලාත්මකභාවයක් ලබාදීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය ලබා දීමට අවශ්‍ය විය හැකි සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ වෙනත් යම් නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයක් යටතේ යම් සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා තත්කාර්ය සඳහා ලිඛිතව බලය දෙන ලද වෙනත් යම් එම නිලධරයකු විසින් කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

2—PL 009969 -425 (2016/05)

ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"සත්ව ආහාර සඳහා බලපත්‍ර ලබා දීමේ අධිකාරිය.

2අ. (1) (මෙහි මින්මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ කාර්යයන් සඳහා බලපත්‍ර ලබා දීමේ අධිකාරිය විය යුතු හෝ කටයුතු කළ යුතු ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවාවේ 1 වන ශ්‍රේණියට අයත් එම ශ්‍රේණියේ වසර තුනකට නොඅඩු ක්‍රියාකාරී සේවයක් ඇති තැනැත්තකු සත්ව ආහාර රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානය සහ පාලනයට යටත්ව මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරා දී ඇති යම් බලතලයක්, කාර්යයක් සහ කර්තව්‍යයක් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"බලපත්‍රදීම.

3. මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් යම් සත්ව ආහාරයක් නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම, කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ "නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු" යන වචන වෙනුවට "නිෂ්පාදනය කිරීම සඳහා හෝ ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (2) වන උපවගන්තියෙහි -

(අ) එහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) (ඉ) ඡේදයේ "ඒ සත්ව ආහාරයේ සංයුතිය" යන වචන වෙනුවට "ඒ සත්ව ආහාරයේ පෝෂ්‍යදයී සංයුතිය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) මේ පනතේ 5 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මත විකිණීම සඳහා නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද යම් සත්ව ආහාරයක් (මෙහි මින්මතු " අනුමත කරන ලද සත්ව ආහාරයක් "යනුවෙන් සඳහන් කරනු ලබන) අනුමත කරන ලද සත්ව ආහාරයක් බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද සත්ව ආහාරය සඳහා අංකයක් වෙන් කර දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අනුමත කරන ලද සත්ව ආහාර විකිණීම.

7. කිසිම තැනැත්තකු විසින් 6 වන වගන්තිය යටතේ ප්‍රකාශිත අනුමත කරන ලද සත්ව ආහාරයක් හැර වෙනත් යම් සත්ව ආහාරයක් විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදහැරීම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 7අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"පරිශ්‍රයන් ලියාපදිංචි කිරීම.

7අ. රෙජිස්ට්‍රාර්වරයා විසින්, නියම කර ඇති ආකාරයට පරිශ්‍රය ලියාපදිංචි කර ඇත්නම් මිස සහ තත්කාර්ය සඳහා වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගෙන ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින්

යම් පරිශ්‍රයක දී අනුමත කරන ලද සත්ව ආහාර විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තැබීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, සැපයීම හෝ බෙදාහැරීම සිදු නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1.) (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන් ; සහ;";

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ "තිදෙනකුගෙන්" යන වචනය වෙනුවට "පස්දෙනකුගෙන්" යන වචනය ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "සාමාජිකයන් තිදෙනකු" යන වචන වෙනුවට "සාමාජිකයන් සිව්දෙනකු" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම (3අ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3අ) රෙජිස්ට්‍රාර්වරයා කමිටුවේ ලේකම්වරයා විය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (i) වන ඡේදයේ "සත්ව ආහාර විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හා පිළියෙල කිරීම" යන වචන වෙනුවට "සත්ව ආහාර විකිණීම සඳහා හෝ භාවිතා කිරීම සඳහා නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම සහ පිළියෙල කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (ii) වන ඡේදයේ "යම් අනුමත කරන ලද සත්ව ආහාරයක" යන වචන වෙනුවට "යම් අනුමත කරන ලද සත්ව ආහාරයක හෝ සත්ව ආහාර වශයෙන් භාවිතා කිරීම සඳහා යෝග්‍ය වෙනත් යම් අමුද්‍රව්‍යයක" යන වචන ආදේශ කිරීමෙන්;

(3) (iii) වන ඡේදයේ "ඉඩදිය හැකි අනර්ථදයක හා නිශ්ක්‍රීය ද්‍රව්‍යවල උපරිම මට්ටම නියම කිරීම;" යන වචන වෙනුවට "ඉඩදිය හැකි අනර්ථදයක හෝ නිශ්ක්‍රීය ද්‍රව්‍යවල උපරිම මට්ටම නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී භාවිතය තහනම් කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (iii) වන ඡේදයට ඉක්බිතිව ම (iiiඅ) ඡේදය ලෙස බලාත්මක විය යුතු පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(iiiඅ) සත්ව ආහාර සහ අමුද්‍රව්‍යවල තත්ත්වයන්ට අදාළ කරුණු පිළිබඳව අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම;".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ඇ) ඡේදයේ "සංයුතිය" යන වචනය වෙනුවට "පෝෂ්‍යදායී ද්‍රව්‍ය සංයුතිය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කමිටුව විසින් අඛණ්ඩව අධ්‍යනය කිරීම හා වාර්තා කිරීම කළ යුතු බව.

12. කමිටුව විසින්-

(අ) පහත සඳහන් කරුණු අධ්‍යයනය කිරීම සහ සමාලෝචනයට භාජනය කිරීම සිදු කළ යුතු ය—

(i) අනුමත කරන ලද සත්ව ආහාර සෑදීම, ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, සකස් කිරීම, බෙදහැරීම සහ භාවිතා කිරීම;

(ii) සත්ව ආහාර පිළියෙල කිරීම;

(ආ) කලින් කල (අ) ඡේදයේ (i) හෝ (ii) වන අනුඡේදවල සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම; සහ

(ඇ) ජාතික ආර්ථිකය සම්බන්ධයෙන් අනුමත කරන ලද සත්ව ආහාර පාලනය, අධීක්ෂණය, භාවිතා කිරීම, අලෙවි කිරීම සහ බෙදාහැරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බවට සලකනු ලබන යෝජනා පිළිබඳ අමාත්‍යවරයා වෙත නිර්දේශ කර සිටීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අනුමත කරන ලද සත්ව ආහාර සෑදීමට, නිෂ්පාදනයට, සකස් කිරීමට, බෙදාහැරීමට හා විකිණීමට" යන වචන වෙනුවට "අනුමත කරන ලද සත්ව ආහාර සෑදීමට, නිෂ්පාදනය කිරීමට, ආනයනය කිරීමට, සකස් කිරීමට, බෙදාහැරීමට, භාවිතා කිරීමට සහ විකිණීමට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "අනුමත කරන ලද යම් සත්ව ආහාරයක බඳුන, මුද්‍රිතය හෝ ලේබලය" යන වචන වෙනුවට "යම් අනුමත කරන ලද සත්ව ආහාරයක් විකිණීම සඳහා අදහස් කරන අවස්ථාවක දී, අනුමත කරන ලද යම් සත්ව ආහාරයක බඳුන, මුද්‍රිතය හෝ ලේබලය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම, පිළියෙල කිරීම, ගබඩා කිරීම" යන වචන වෙනුවට "විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, පිළියෙල කිරීම හෝ ගබඩා කිරීම" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ "ඒ අනුමත කරන ලද සත්ව ආහාරය විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම හෝ විකිණීම හෝ" යන වචන වෙනුවට "ඒ අනුමත කරන ලද සත්ව ආහාරය විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම, භාවිතා කිරීම හෝ විකිණීම" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) (1) වන උපවගන්තියේ "අනුමත කරන ලද යම් සත්ව ආහාරයක කිසිම නිෂ්පාදකයකු හෝ බෙදහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු" යන වචන වෙනුවට "අනුමත කරන ලද සත්ව ආහාරයක කිසිම නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු හෝ බෙදහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) (2) වන උපවගන්තියේ "අනුමත කරන ලද යම් සත්ව ආහාරයක යම් නිෂ්පාදකයකු, බෙදහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු" යන වචන වෙනුවට " යම් සත්ව ආහාරයක යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු හෝ බෙදහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු" යන වචන ආදේශ කිරීමෙන්;

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(1) මේ පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියමයන්ගේ කාර්යයන් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලයලත් නිලධරයකු වශයෙන් නමින් හෝ ධුරයෙන් යම් රාජ්‍ය නිලධරයකු නම් කරනු ලැබිය හැකි ය.";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම (1අ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත සඳහන් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) (1) වන උපවගන්තිය යටතේ නම් කරනු ලබන සෑම බලයලත් නිලධරයකු ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "සත්ව ආහාරය විකිණීම පිණිස තම සන්තකයෙහි තබා ගන්නා වූ යම් තැනැත්තකුගෙන් ලබා ගැනීම;" යන වචන වෙනුවට "සත්ව ආහාරය විකිණීම සඳහා හෝ වෙනත් යම් භාවිතා කිරීමක් සඳහා තම සන්තකයෙහි තබා ගන්නා වූ යම් තැනැත්තකුගෙන් ලබා ගැනීම;" යන වචන ආදේශ කිරීමෙන්.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තියේ "තීරක විශ්ලේෂක" යන වචන වෙනුවට "බලයලත් විශ්ලේෂක හෝ තීරක විශ්ලේෂක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (2) වන උපවගන්තියේ "තීරක විශ්ලේෂක" යන වචන වෙනුවට "බලයලත් විශ්ලේෂක හෝ තීරක විශ්ලේෂකට" යන වචන ආදේශ කිරීමෙන්;

(3) (3) වන උපවගන්තියේ "තීරක විශ්ලේෂක" යන වචන වෙනුවට "බලයලත් විශ්ලේෂක හෝ තීරක විශ්ලේෂක" යන වචන ආදේශ කිරීමෙන්.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම (අඅ) ඡේදය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) ස්වයං මිශ්‍රිත සත්ව ආහාර නිෂ්පාදන සඳහා වූ ප්‍රමිති නියම කිරීම; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "සත්ව ආහාරය" යන යෙදුමේ අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථනිරූපනය ඇතුළත් කිරීමෙන්:—

"සතා" යන්න සඳහා 1992 අංක 59 දරන සත්ව රෝග පනතෙන් ඊට දී ඇති අර්ථයම විය යුතු ය; ";

(2) "සංයෝග කරන ලද ආහාර" යන යෙදුමේ අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථනිරූපන ඇතුළත් කිරීමෙන්:—

"ආනයන සහ අපනයන පාලකවරයා" යන්නෙන්, 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ආනයන සහ අපනයන පාලකවරයා අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වයා අදහස් වේ;

"බෙදාහරින්නා" යන්නෙන්, යම් නිෂ්පාදකයකුගෙන්, ආනයනකරුවකුගෙන් හෝ වෙළෙන්දකුගෙන් පිළිවෙලින් යම් සිල්ලර වෙළෙන්දකුට, විකුණන්නකුට හෝ භාවිතා, කරන්නෙකුට ලැබුනු සත්ව ආහාර බෙදාහරිනු ලබන තැනැත්තකු අදහස් වේ";

(3) "තීරක විශ්ලේෂක" යන යෙදුමේ අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථනිරූපනය ඇතුළත් කිරීමෙන්:—

"ස්වයං මිශ්‍රිත සත්ව ආහාර" යන්නෙන්, යම් තැනැත්තකු තමා සන්තකයේ තබා ගෙන ඇති සතුන් සඳහා හෝ කුකුළන් සඳහා ආහාරයක් වශයෙන් භාවිතා කරනු ලබන ආහාර ද්‍රව්‍ය දෙකක් හෝ වැඩි ගණනක මිශ්‍ර කිරීමෙන් ලබා ගන්නා ආහාර අදහස් වේ;";

(4) "විකුණන්නා" යන අර්ථනිරූපනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථනිරූපනය ආදේශ කිරීමෙන්:—

"විකුණන්නා" යන්නෙන්, අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් සිල්ලර වශයෙන් විකිණීමේ කාර්ය සඳහා යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් යම් තැනැත්තකු වෙත විකුණනු ලබන්නේ ද හෝ යම් තැනැත්තකු වෙත භාරදෙනු ලබන්නේ ද එම, තැනැත්තා අදහස් වන අතර, ඒ සඳහා ඒකාබද්ධ ගිවිසුම්ගත ගොවිපොලක වැඩපිළිවෙලක් යටතේ අනුමත කරන ලද සත්ව ආහාර හුවමාරු කරනු ලබන හෝ සපයනු ලබන තැනැත්තකු ද ඇතුළත් වන අතර, "විකිණීම" යන වචනය ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය".

(5) "සරල ආහාරය" යන යෙදුමේ, අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථනිරූපනය ඇතුළත් කිරීමෙන් :—

"භාවිතාකරන්නා" යන්නෙන්, තමාගේ සන්තකයේ සිටින සතුන් හෝ කුකුළන් සඳහා හෝ ආහාර නිෂ්පාදනය සඳහා තමාගේ සන්තකයේ යම් සත්ව ආහාරයක් තබාගෙන සිටින යම් තැනැත්තකු අදහස් වේ.".

"සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා" සහ "අධ්‍යක්ෂවරයා" "සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" ලෙස හඳුන්වනු ලැබිය යුතු බව.

**25.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා" සහ "අධ්‍යක්ෂවරයා" යන වචන යෙදී ඇති සෑම ස්ථානයක් සඳහා ම පිළිවෙළින් "සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ යම් නිවේදනයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "සත්ව නිෂ්පාදන හා

සෞඛ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා” සහ “අධ්‍යක්ෂවරයා” යන යෙදුම භාවිතා වී ඇති සෑම සඳහනක් ම පිළිවෙළින් , “සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා” සහ “අධ්‍යක්ෂ ජනරාල්වරයා” යන යෙදුම සඳහා වූ සඳහන් කිරීමක් ලෙස කියවා අවබෝධ කරගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**26.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.